# සංක්ෂිප්තය

ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ ප්‍රාථමික අධ්‍යාපන පාඨමාලාව හදාරන ගුරු සිසුන්ගේ කාණ්ඩ ඉගැන්වීම් පුහුණුව පිළිබඳ විමර්ශනය කිරීම සඳහා මෙම අධ්‍යයනය සිදු කරන ලදී. මෙහිදී කාණ්ඩ ඉගැන්වීම පුහුණුව පිළිබඳ ගුරු සිසුන්ගේ සහ කථිකාචාර්යවරුන්ගේ සංජානන විමසා බැලීම, කාණ්ඩ ඉගැන්වීම් පුහුණුව ක්‍රියාත්මක වන ආකාරය විමර්ශනය කිරීම, කාණ්ඩ ඉගැන්වීම් පුහුණුව ආශ්‍රිත ගැටලු විමසා බැලීම සහ කාණ්ඩ ඉගැන්වීම පුහුණු ආශ්‍රිත ගැටලු සඳහා විසඳුම් ඉදිරිපත් කිරීම යන්න පිහිටුවා ගත් සුවිශේෂි අරමුණු වේ. මෙම පර්යේෂණය සඳහා ප්‍රමාණාත්මක පර්යේෂණ ප්‍රවේශය යොදා ගත් අතර අධ්‍යයනයේ තොරතුරු අනාවරණය කර ගැනීමට සමීක්ෂණ පිරිසැලසුම යටතේ නියදි සමීක්ෂණ ක්‍රමයට අනුව අධ්‍යයන සිදු කරන ලදී. පර්යේෂණ අරමුණු ඉටුකර ගැනීම සඳහා ගුරු සිසු හා කථිකාචාර්ය මණ්ඩලය ලෙස නියදි දෙකක් භාවිත කළ අතර ඒ සඳහා හාපිටිගම, වයඹ සහ සාරිපුත්ත - දඹදෙණිය යන විද්‍යාපීඨයන්හි 2017-2019 අධ්‍යයන වර්ෂයට අයත් ප්‍රාථමික අධ්‍යාපන පාඨමාලාව හදාරන ගුරු සිසුන් 112 දෙනෙකු හා එකී පීඨයන්හි කථිකාචාර්යවරුන් 35 දෙනෙකු සහේතුක නියදිකරණය මඟින් තෝරා ගන්නා ලදී. මෙහි දත්ත රැස් කිරීම සඳහා ප්‍රධාන වශයෙන් ප්‍රශ්නාවලි ක්‍රමය භාවිත කළ අතර ඊට අමතරව සම්මුඛ සාකච්ඡා, නිරීක්ෂණ, සහ ලේඛන පරීක්ෂා කිරීම යන ක්‍රමද යොදා ගන්නා ලදී. මෙම අධ්‍යයනයේදී ප්‍රමාණාත්මක හා ගුණාත්මක යන දෙආකාරයෙන්ම දත්ත එකතු කළ බැවින් දත්ත විශ්ලේෂණය සඳහා ප්‍රමාණාත්මක හා ගුණාත්මක දත්ත විශ්ලේෂණ ක්‍රම භාවිත කරන ලදී. මෙහිදී දත්ත විශ්ලේෂණය මඟින් එළඹි අනාවරණ ලෙස කාණ්ඩ ඉගැන්වීම් පුහුණුව ක්‍රියාත්මක වන දින ගණන, අදියර ගණන ප්‍රමාණවත් වුවද නිරීක්ෂණය කරන පාඩම් ගණන ප්‍රමාණවත් නොවන බව, කාණ්ඩ ඉගැන්වීම් පුහුණුව අරභයා විද්‍යාපීඨය මඟින් ලබා දෙන ප්‍රායෝගික දැනුම ප්‍රමාණවත් නොවීම, සහ කාණ්ඩ ඉගැන්වීම පුහුණුව පාසල් තුළ ක්‍රියාත්මක වීමෙන් ඉගැන්වීම් කුසලතාවන්ගෙන් 25% ක ප්‍රගතියක් පමණක් ගුරු සිසුන් අත්පත් කර ගෙන ඇති බවත් ය. එසේම කාණ්ඩ ඉගැන්වීම් පුහුණුවේදී ගුරු සිසුන් දුර පාසල්වලට ස්ථානගත කිරීම, ගුරුභවතුන් විසින් කාලසටහන ලබා දීමට ඇති අකමැත්ත, පාසල් තුළ ස්ථානගත වීමට ඉඩක් නොලැබීම, ප්‍රායෝගික ඉගැන්වීම් පුහුණුවට විද්‍යාපීඨයේ ඇති අවස්ථා සීමා වීම යනාදිය ප්‍රධාන වශයෙන් මුහුණ දෙන ගැටලු බව අනාවරණය විය. ගුරු සිසුන් මුහුණ දෙන මෙම ගැටලු අවම කර ගැනීම සඳහා හැකි සෑම විටම විද්‍යාපීඨය ආසන්න පාසල්වලට පමණක් අනුයුක්ත කිරීම, විද්‍යාපීඨයේදී ඉගැන්වීම් පුහුණුවට ඇති අවස්ථා පුළුල් කිරීම, විද්‍යාපීඨය මඟින් පාසල්වල විදුහල්පතිවරුන් හා ගුරුවරුන් දැනුවත් කිරීම යනාදිය ප්‍රධාන වශයෙන් අවධානය යොමුකළ යුතු යෝජනා බව දක්වා ඇත.

Abstract

This study was conducted in order to investigate the block teaching of the primary teacher trainees at National Colleges of Education. To investigate the perception of the lecturers and teacher trainees regarding block teaching, how to is impleamented and also to find out solutions for the problems arisen duting the block teaching sessions are the specific objectives of this study. Quantitative research approach was selected to do this research and sample survey method was used to find out the facts of the study. Two samples were used in the study; 35 lecturers and 112 students. Questionnairre was used as the main method to collect data. Futher, the methods suel as interviews observation and were also used to collect data. Both qualitative and quantitative was used to analyse the data, as data was collected using both qualitative and quantitative methods. It was revealed that the trainees are satisfactory about the days and stages of the block teaching sessions at college. Yet, the supervised number of lessons and the theoritical knowledge gained during the Education Practice session are not satisfactory. As a consequence, only 25 percentages of progress was achieved in teaching skills. Long distance schools get during, the block teaching sessions, teachers reluetante to give time tables, and not allowing teacher traainess to adjust to the school, lack of opportunity in the colledge for teaching practice are the major problems that trainees encountered during the block teaching sessions. Giving teacher trainees closer schools near to the college during block teaching session, making principals and teacher aware of block teaching are the factors that should be given more consideration.